# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,266 - 2022 පෙබරවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 156 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 159 |



*සැ. යු.*- (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 පෙබරවාරි මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 පෙබරවාරි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

153 - B 82313 — 5,413 (2022/02)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

බාහිර දේශක / උපදේශක සඳහා බාහිර සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම - 2022 අධ්‍යයන වර්ෂය

මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාලවල බාහිර / උපදේශක තනතුරු සඳහා බාහිර සම්පත් දායකයින් ලියාපදිංචි කිරීමට මෙම නිවේදනය අවසානයේ දක්වා තිබෙන තාක්ෂණ විද්‍යාලවල /කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂවරුන් / විදුහල්පතිවරුන් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාලවල බාහිර පදනම මත දේශන පැවැත්වීමට නියමිතව තිබෙන විෂයයන් පිළිබඳ විස්තර සහ ආදර්ශ අයදුම්පත්‍රය තමා සේවය කිරීමට අදහස් කරන තාක්ෂණ විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත (9" X 4"ප්‍රමාණයේ) තම ලිපිනය සහ මුද්දර ඇලවූ ලියුම් කවරයක් යැවීමෙන් ලබාගත හැකි වේ. ඔබ එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "බාහිර සම්පත් දායකයින්'' යනුවෙන් සඳහන් කරන්න. නොඑසේ නම් අදාළ තාක්ෂණ විද්‍යාලවලට / කාර්මික විද්‍යාලවලට පැමිණ මෙම විස්තර ලබාගත හැක.

03. අදාළ පාඨමාලා විස්තර පත්‍රිකා සහ ආදර්ශ අයදුම්පත්‍ර ලබාගත හැකි අවසාන දිනය **2022.02.28** වැනි දින වේ. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2022.03.15** වේ.

04. අපේක්ෂකයින් සඳහා පොදු විස්තර :

I. අපේක්ෂකයින් විසින් තම අධ්‍යාපන, වෘත්තීය හා කාර්මික අංශයේ ලබා ඇති සුදුසුකම් හා අදාළ විෂයයන් ඉගැන්වීමේ හෝ අදාළ ක්ෂේත්‍රයේ කටයුතු කිරීමේ පලපුරුද්ද පිළිබඳ සියලුම විස්තර අයදුම්පත යැවීමේදී පැහැදිලිව සඳහන් කිරීමට වගබලා ගත යුතුවේ.

II. ගාස්තු ගෙවීම :
බාහිර සම්පත් දායකයින්හට ගෙවන ගාස්තුව ඔවුන්ගේ අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා පාඨමාලාවේ මට්ටම් අනුව පැයකට රු. 500/= සිට රු.1,000/= දක්වා වෙනස් වනු ඇත.

III. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම :
රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ තම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා මගිනි. මෙවැනි අපේක්ෂකයෙක් මෙම බාහිර උපදේශක කාර්යය සඳහා තෝරාගතහොත් එලෙස සේවයේ යෙදීම නිසා සිය රාජකාරි කටයුතුවලට බාධා නොවන බවට තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරවා ගැනීමට අපේක්ෂකයා විසින් වගබලා ගත යුතු වේ.

IV. තෝරා ගැනීම :
ලියාපදිංචිය සඳහා තෝරා ගනු ලබන්නේ අදාළ තාක්ෂණ විද්‍යාලයේ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමෙන් පසුවය. තෝරා ගැනීමේ දී, අදාළ විෂයයන් ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින් හට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයෙකුගේ බාහිර උපදේශක පත්වීම විද්‍යාලයේ අවශ්‍යතාව අනුව ලිඛිතව නිසි හේතු දැක්වීමකින් පසුව ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට අධ්‍යක්ෂ / විදුහල්පතිට හැකි බවද සැලකිය යුතුවේ.

V. මෙලෙස ලියාපදිංචි වන බාහිර සම්පත්දායකයින් තමා ඉගැන්වීම් සිදුකරන තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි වර්ෂ අවසාන / අභ්‍යන්තර විභාග කටයුතු සඳහා කිසිදු අමතර ගාස්තුවක් නොමැතිව සහභාගී විය යුතු වේ.

05. මෙම ලියාපදිංචිය 2022 අධ්‍යයන වර්ෂය සඳහා පමණක් වන අතර, කිසිදු ස්ථිර තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොමැත.

06. ඉල්ලුම්පත්‍ර එවීමේදී, විෂයන් එකකට වඩා ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් විෂයය සඳහා වෙන වෙනම ඉල්ලුම් පත්‍ර එවිය යුතු වේ. මෙම සෑම අයදුම්පතක්ම තමා ඉගැන්වීම් සිදුකිරීමට අපේක්ෂා කරන තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු වේ. විද්‍යුත් තැපෑල (email) මගින්ද මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කල හැකි බැවින් එක් එක් විද්‍යාලයේ විද්‍යුත් තැපැල් (email) ලිපිනයන් ද මෙම දැන්වීමේ දක්වා ඇත.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

ඕල්කොට් මාවත.
කොළඹ 10.
www.dtet.gov.lk

තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල ලැයිස්තුව.

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය | විද්‍යාලයේ දුරකථන අංකය හා ඊ මේල් ලිපිනය |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ | 011-2324177<br>slotmaradana@dtet.gov.lk |
| 02 | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල | ගාල්ල | 091-2234871<br>cotgalle@dtet.gov.lk |
| 03 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල, මහනුවර | මහනුවර | 081-2224063<br>cotkandy@dtet.gov.lk |
| 04 | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය | 021-2222358<br>cotjaffna@dtet.gov.lk |
| 05 | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල | 055-2222413<br>cotbadulla@dtet.gov.lk |
| 06 | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය | 025-2222666<br>cotanuradhapura@dtet.gov.lk |
| 07 | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම පාර, කුරුණෑගල | කුරුණෑගල | 037-2223264<br>cotkurunegala@dtet.gov.lk |
| 08 | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉඟිනියාගල පාර, අම්පාර | අම්පාර | 063-2223485<br>cotampara@dtet.gov.lk |
| 09 | රත්නපුරය තාක්ෂණ විද්‍යාලය | ෆාම් ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය | 045-2232390<br>cotratnapura@dtet.gov.lk |
| 10 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල | 035-2222441<br>tckegalle@dtet.gov.lk |
| 11 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලුපාර, රත්මලාන | කොළඹ | 011-2612877<br>tcratmalana@dtet.gov.lk |
| 12 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර | මාතර | 041-2222565<br>tcmatara@dtet.gov.lk |
| 13 | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ | අම්පාර | 067-2260086<br>tcsammanthurai@dtet.gov.lk |
| 14 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර | 034-2222325<br>tckalutara@dtet.gov.lk |
| 15 | වරකාපොල කාර්මික විද්‍යාලය | අඟුරුවැල්ල පාර, වරකාපොල | කෑගල්ල | 035-2267651<br>tcwarakapola@dtet.gov.lk |
| 16 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල | 037-2281181<br>tckuliyapitiya@dtet.gov.lk |
| 17 | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට | මහනුවර | 081-2499782<br>tcpathadumbara@dtet.gov.lk |
| 18 | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය | නුවරඑළිය | 052-2222658<br>tcnuwaraeliya@dtet.gov.lk |
| 19 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම | කොළඹ | 011-2855315<br>tchomagama@dtet.gov.lk |
| 20 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට | 047-2243229<br>tcbeliatta@dtet.gov.lk |
| 21 | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක | මහනුවර | 055-2257129<br>tchasalaka@dtet.gov.lk |

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය | විද්‍යාලයේ දුරකථන අංකය හා ඊ මේල් ලිපිනය |
|---|---|---|---|---|
| 22 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ | 066-2284713 tcdambulla@dtet.gov.lk |
| 23 | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රිය පොළ පාර, වඳුරුව, බලපිටිය | ගාල්ල | 091-2258096 tcbalapitiya@dtet.gov.lk |
| 24 | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | කුරුණෑගල | 037-2267256 tcwariyapola@dtet.gov.lk |
| 25 | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්චන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව | 065-2246557 tcbatticaloa@dtet.gov.lk |
| 26 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල | බදුල්ල | 057-2222753 tcbandarawela@dtet.gov.lk |
| 27 | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල | මොණරාගල | 055-2276167 tcmoneragala@dtet.gov.lk |
| 28 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල | ගම්පහ | 033-2222132 tcgampaha@dtet.gov.lk |
| 29 | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 026-2223034 tctrincomalee@dtet.gov.lk |
| 30 | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය | අම්පාර | 027-2230117 tcdehiattakandiya@dtet.gov.lk |
| 31 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී. පාර, මාතලේ | මාතලේ | 066-2224196 tcmatale@dtet.gov.lk |
| 32 | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | හම්බන්තොට | 047-2237064 tcweerawila@dtet.gov.lk |
| 33 | මැදගම කාර්මික විද්‍යාලය | මැදගම බිබිලේ හරහා | මොණරාගල | 055-2266113 tcmedagama@dtet.gov.lk |
| 34 | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව | පොළොන්නරුව | 027-2224428 tcpolonnaruwa@dtet.gov.lk |
| 35 | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නව නගරය, ඇඹිලිපිටිය | රත්නපුර | 047-2261037 tcembilipitiya@dtet.gov.lk |
| 36 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | වවුනියාව | 024-2223664 tcvavuniya@dtet.gov.lk |
| 37 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව. | අම්පාර | 067-2279326 tcakkaraipattu@dtet.gov.lk |
| 38 | ආණමඩුව කාර්මික විද්‍යාලය | නව ගත්තේගම පාර, ආණමඩුව. | පුත්තලම | 032-2263288 tcanamaduwa@dtet.gov.lk |
| 39 | මන්නාරම කාර්මික විද්‍යාලය | පන්නායි, වෙඩ්ඩුවන් හන්දිය, මඩුපාර | මන්නාරම | 023-3238532 tcmannar@dtet.gov.lk |

02-35/1

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**තාක්ෂණ/ කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන පාඨමාලා**
**සඳහා සිසුන් ඇතුළත් කරගැනීම - 2022**

මෙම නිවේදනයේ සඳහන් තාක්ෂණ / කාර්මික විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගනු ලැබේ.

2. මෙම දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත් අයදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතු වේ. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022/03/15 වැනි දිනට හෝ ඊට පෙර අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. *නැතහොත්* අදාළ විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශයට පැමිණ භාර දීමට අවස්ථාව ඇත. අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවට හෝ කිසියම් නිලධාරියෙකුගේ නමට හෝ පුද්ගලික ලිපිනයට යොමු නොකරන ලෙසට අයදුම්කරුවන් හට උපදෙස් දෙනු ලැබේ.

එමෙන්ම, මේ පිළිබඳ විස්තර www.dtet.gov.lk වෙබ් අඩවියෙහි පළකර ඇති අතර අයදුම්පත්‍රය එම වෙබ් අඩවිය හරහා හෝ mis.dtet.gov.lk මගින්ද මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළ හැක.

3. අයදුම්පත යොමු කරන කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා පාඨමාලා කේතය යොදන්න.
උදා. ඉදිකිරීම් තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව - ETB 05

4. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, පාඨමාලාවේ පුරප්පාඩු පවතී නම් පමණක් සලකා බලනු ඇත.

5. NVQ මට්ටම් 4/5 සහ 6 මට්ටමේ සියලුම පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා හයමාසික කර්මාන්තගත පුහුණුව අනිවාර්ය වේ.

6. වයස අවුරුදු 29ට අඩු අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

7. I. සියලුම ඩිප්ලෝමා මට්ටමේ (NVQ මට්ටම 05 හා 06) පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. ඒ සඳහා උපකාරක විෂයක් ලෙස ඉංග්‍රීසි භාෂාව මොඩියුලයක් ඇතුළත් වේ.
II. භාෂා පාඨමාලා හැර සියළුම NVQ මට්ටම 03/04 පාඨමාලා සිංහල/දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.
III. NVQ මට්ටම් 05 පාඨමාලාවන් සඳහා සුදුසුකම ලෙස NVQ මට්ටම 03න් ඇතුළත් වන සිසුන් පාඨමාලාවේ අවසන් සමාසිකයේ විභාගයට පෙර NVQ මට්ටම් 04 සුදුසුකම ලබාගත යුතු වේ.

8. පාඨමාලාවල ස්වභාවය, ඒ ඒ පාඨමාලා සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම්, එම පාඨමාලා පැවැත්වෙන විද්‍යාල සහ පාඨමාලා පැවැත්වෙන භාෂා මාධ්‍යය මෙම දැන්වීමේ අග දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛනයෙහි අඩංගු බැවින් එම ලේඛනය කෙරෙහි සියළුම අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල තැපැල් ලිපිනයන් හා දුරකතන අංක එම ලැයිස්තුවෙහි සඳහන් වේ. විද්‍යාලය හෝ පාඨමාලාව මාරුකිරීමට පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

9. සියලුම පූර්ණ කාලීන දිවා පාඨමාලා නොමිලේ පැවැත්වේ.

10. අර්ධ කාලීන හා සතිඅන්ත පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියලුම සිසුන්ගෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කෙරේ.

I. පාඨමාලා කාලය වසරකට වැඩි (අර්ධ කාලීන හා සතිඅන්ත) පාඨමාලා සඳහා එක් වසරකට එක් ශිෂ්‍යයෙකු රු. 25,000 මුදලක් ගෙවිය යුතුය.
II. පාඨමාලා කාලය මාස 6 සිට වසරක් දක්වා වන (අර්ධ කාලීන හා සතිඅන්ත) පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව වශයෙන් එක් ශිෂ්‍යයෙකු රු. 30,000/- මුදලක් ගෙවිය යුතුය.
(පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැකි අතර පළමු වාරිකය ශිෂ්‍ය ලියාපදිංචියේ දී රු. 15000/- හා දෙවන වාරිකය ලෙස ඉතිරි මුදල පාඨමාලා ආරම්භයේ සිට මාස 6ක් ඉක්මවීමට පෙර ගෙවිය යුතු ය.)
III. හයමාසික පාඨමාලා සඳහා රු. 20,000 ක මුදලක් ගෙවිය යුතුය.
IV. පාඨමාලා කාලය මාස 3 හෝ ඊට වැඩි පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව වශයෙන් එක් ශිෂ්‍යයෙකු රු. 10,000 මුදලක් ගෙවිය යුතුය. (ආයතනය තුළ අධ්‍යයන කාලය සළකා ගාස්තු අය කිරීමට කටයුතු කරන්න.)

11. මෙහි අ.පො. ස. (උ/පෙ) විෂයන් තුනකින් සමත් වී තිබීම ලෙස අදහස් කරනු ලබන්නේ විෂය ධාරාවේ ප්‍රධාන විෂයයන් 03 වේ. සාමාන්‍ය ඉංග්‍රීසි (General English) හා සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විෂයන් මේ සඳහා අදළ නොවේ.

12. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය ලබාගැනීම සඳහා පෙනී සිටිය යුතු තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පවත්වනු ලබන පොදු විභාගය සඳහා පෙනී සිටීමට, සිසුවෙකුගෙන් රු. 900/- ක මුදලක් කොමිෂන් සභාව අය කරනු ලබයි.

13. මෙම තාක්ෂණ/ කාර්මික විද්‍යාලයන්හි පාඨමාලා හැදෑරීමට ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවකුම/ඉල්ලුම්කාරියකම

I. මනා චරිතයකින් යුක්ත විය යුතුය.
II. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
III. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත්කරන අවස්ථාවේ දී ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

14. සුදුස්සන් තෝරාගනු ලබන්නේ අදාළ විෂය දැනුම සහ පාඨමාලාව පැවැත්වෙන භාෂා මාධ්‍යයෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමේ ලිඛිත විභාගයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

15. ලිපි ලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපි ලේඛන ඉදිරිපත් නොකර යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

16. තෝරාගනු බලන පූර්ණ කාලීන සිසුන් සඳහා පහත දැක්වෙන අමතර වාසි සහ වරප්‍රසාද හිමි වේ.

I. පූර්ණ කාලීන දිවා පාඨමාලා හදාරන සිසුන් සඳහා ලංගම හා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර අවශ්‍යතාව මත ලබා ගත හැකිය.
II. තෝරාගත් පාඨමාලාවන් සඳහා අඩු ආදයම් ලාභී පවුල්වල දරුවන්ට (වාර්ෂික ආදයම රු. 500,000 ට අඩු පවුල්වල) නිපුණතා සිසු සවිය යටතේ මාසිකව රු. 4000 උපරිමයකට යටත්ව පැමිණීම මත දීමනාවක් හිමි වේ.

17. සිය ලිපි ලේඛනවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන් ම වගකිව යුතුය. වංචනික හෝ වෙනස් කිරීම් සහිත ලිපි ලේඛන ඉදිරිපත් කරන හෝ අයදුම්පතෙහි සඳහන් කරුණු සනාථ වන සේ ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. කිසියම් විද්‍යාලයක පවත්වන පාඨමාලාවක පළමු/දෙවන/තෙවන වසර සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාව එම පාඨමාලාව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී එම සිසුන් අදාළ පාඨමාලාව පැවැත්වෙන ආසන්නතම තාක්ෂණ/කාර්මික විද්‍යාලයකට මාරු කරනු ලැබේ.

19. අර්ධකාලීන පාඨමාලාවක් සඳහා ඉල්ලුම්කරන අයදුම්කරුවන් තමන් අදළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වන බව තහනම් කිරීම සඳහා සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

20. පාඨමාලා සම්බන්ධ වැඩිදුර තොරතුරු වෘත්තීය මාර්ගෝපදේශණ අංශයේ 011-2348893 යන දුරකතන අංකය ඇමතීමෙන් සහ dtet.gov.lk යන වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

21. අවසන් විභාගය සහ ඇගයීම් සඳහා සුදුසුකම් ලැබීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අවම වශයෙන් 75% සහභාගිත්වයක් තිබිය යුතු අතර අඛණ්ඩ ඇගයීම්වලදී අවම සාධන මට්ටමට ඉහළින් උපයාගෙන තිබීම අත්‍යවශ්‍ය වේ. එසේ නොවන අවස්ථාවලදී අවසන් විභාග හා ඇගයීම් සඳහා පෙනීසිටීමට අවස්ථාවක් හිමි නොවේ.

22. පාඨමාලා කේතයන් BSA,BSC, ECC, ETA, ETB, ETC, ESC හා MCC යටතේ හඳුන්වා දී ඇති පාඨමලාවන් සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් අවසන් විභාගයක් පැවැත්වේ. අනෙකුත් කේත සඳහා දෙපාර්තමේන්තු විභාගයක් නොපැවැත්වෙන අතර අවස්ථාවෝචිතව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින්/ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා නිපුණතාවය මත NVQ සහතික පිරිනමනු ලැබේ.

23. මෙම *ගැසට් පත්‍රයෙහි* සඳහන් තාක්ෂණ විද්‍යාලවල සහ කාර්මික විද්‍යාලවල 2022 අධ්‍යයන වර්ෂයෙහි පැවැත්වීමට නියමිත පාඨමාලා සියල්ලම පැවැත්වීම හෝ කිහිපයක් පැවැත්වීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි වේ.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත, කොළඹ 10.
www.dtet.gov.lk

තාක්ෂණ/කාර්මික විද්‍යාල ලැයිස්තුව

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දුරකතන අංකය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 01 | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉගිනියාගල පාර, අම්පාර. | 063-2223485<br>063-2224236 | අම්පාර |
| 02 | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | නවනගරය, අනුරාධපුරය. | 025-2222666<br>025-2224710 | අනුරාධපුරය |
| 03 | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන්ඩ්රයිව්, බදුල්ල. | 055-2222413<br>055-2225640 | බදුල්ල |
| 04 | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල. | 091-2234051<br>091-2225985<br>091-2234871 | ගාල්ල |
| 05 | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය. | 021-2220028<br>021-2222358 | යාපනය |
| 06 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය, මරදාන | ඕල්කොට් මාවත, කොළඹ 10. | 011-2324177<br>011-2423653 | කොළඹ |
| 07 | රත්නපුර තාක්ෂණ විද්‍යාලය | ෆාම්ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුරය. | 045-2232390<br>045-2224715 | රත්නපුර |
| 08 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල, මහනුවර. | 081-2224063<br>081-2211810 | මහනුවර |
| 09 | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම පාර, කුරුණෑගල. | 037-2223264<br>037-2227611 | කුරුණෑගල |
| 10 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව. | 067-2279326<br>067-2279602 | අම්පාර |
| 11 | ආණමඩුව කාර්මික විද්‍යාලය | නවගත්තේගම පාර, ආණමඩුව. | 032-2263288<br>032-2263163 | පුත්තලම |
| 12 | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රියපොළ පාර, වඳුරුව, බලපිටිය. | 091-2258096<br>091-2255248 | ගාල්ල |
| 13 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල. | 057-2222754<br>057-2233753 | බදුල්ල |
| 14 | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්චන්තුඩුවෙයි, මඩකලපුව. | 065-2246557<br>065-3659455 | මඩකලපුව |
| 15 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත. | 047-2243229<br>047-2251255 | හම්බන්තොට |
| 16 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේපාර, දඹුල්ල. | 066-2284713<br>066-2284885 | මාතලේ |
| 17 | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය. | 027-2230117<br>027-2250262 | අම්පාර |
| 18 | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නවනගරය, ඇඹිලිපිටිය. | 047-2261037<br>047-2261608 | රත්නපුර |
| 19 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල. | 033-2222132<br>033-2233253 | ගම්පහ |
| 20 | හසලක කාර්මික විද්‍යාලය | යෝධඇළ පාර, හසලක. | 055-2257129<br>055-2258225 | මහනුවර |

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දුරකතන අංකය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 21 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම. | 011-2855315<br>011-2857133 | කොළඹ |
| 22 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර. | 034-2222325<br>034-2236622 | කළුතර |
| 23 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල. | 035-2222441<br>035-2223319 | කෑගල්ල |
| 24 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය. | 037-2281181<br>037-2281271 | කුරුණෑගල |
| 25 | මන්නාරම කාර්මික විද්‍යාලය | පන්නායි, වෙඩ්ඩුවන් හන්දිය, මඩුපාර. | 023-3238532 | මන්නාරම |
| 26 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී. පාර, මාතලේ. | 066-2224196<br>066-2224847 | මාතලේ |
| 27 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර. | 041-2222565<br>041-2229998 | මාතර |
| 28 | මැදගම කාර්මික විද්‍යාලය | බිබිලේ පාර, මැදගම. | 055-2266113<br>055-2266112 | මොණරාගල |
| 29 | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල. | 055-2276167<br>055-2277448 | මොණරාගල |
| 30 | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය. | 052-2222658<br>052-2235895 | නුවරඑළිය |
| 31 | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට. | 081-2499782<br>081-2500441 | මහනුවර |
| 32 | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව. | 027-2224429<br>027-2224428 | පොළොන්නරුව |
| 33 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලු පාර, රත්මලාන. | 011-2632778<br>011-2626955<br>011-2612877 | කොළඹ |
| 34 | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ. | 067-2260933<br>067-2260086 | අම්පාර |
| 35 | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය. | 026-2223034<br>026-2227956 | ත්‍රිකුණාමලය |
| 36 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | 024-2223664<br>024-2226720 | වවුනියාව |
| 37 | වරකාපොල කාර්මික විද්‍යාලය | අගුරුවැල්ල පාර, වාරියපොල | 035-2267651<br>035-2268302 | කෑගල්ල |
| 38 | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | 037-2267256<br>037-2268380 | කුරුණෑගල |
| 39 | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | 047-2237064<br>047-2237032 | හම්බන්තොට |

ආදර්ශ අයදුම්පත්‍රය

**තාක්ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය - 2022 අධ්‍යයන වර්ෂය**

| |
|---|
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |

වැදගත් : (අයදුම්පත්‍රය අදාළ තාක්ෂණ විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ/විදුහල්පති වෙතට යැවිය යුතුය. තාක්ෂණ/කාර්මික විද්‍යාලවල ලිපිනයන් තාක්ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාල ලැයිස්තුවේ දක්වා ඇත.)

1. තාක්ෂණ විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ නම

2. ඉල්ලුම් කරන පාඨමාලාවේ නම සහ පාඨමාලා කේතය :

3. ජාතික හැඳුනුම්පත් අංකය :

4. භාෂා මාධ්‍යය : සිංහල/දෙමළ

5. අයදුම්කරුගේ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

6. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

7. මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :

..........................................................................................................................

..........................................................................................................................

8. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

9. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :..........................................................................................

..........................................................................................

10. උපන් දිනය : | | | | | | | | | 2022.01.01 වැනි දිනට වයස ඃ අවුරුදු ඃ | | මාස ඃ | | දින ඃ | |

11. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

12. අයදුම්කරුගේ පදිංචිය පිළිබඳ තොරතුරු ඃ

පළාත : | | දිස්ත්‍රික්කය : | |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : | | ග්‍රාම නිලධාරී කොට්ඨාසය : | |

13. දුරකතන අංකය ඃ නිවස : | | | | | | | | | | |

ජංගම : | | | | | | | | | | |

14. NVQ සුදුසුකම් මත පාඨමාලාවලට ඇතුළත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් සඳහා ඃ

| ලබා ඇති NVQ සහතිකයේ නම (වෘත්තීය ක්ෂේත්‍රය ද සමග) | NVQ මට්ටම | පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම | අදාළ සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර කෙටියෙන් | හැදෑරූ පාඨමාලා කාලය අවුරුදු / මාස |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

15. *අධ්‍යාපන සුදුසුකම් ඃ*

(*අ*) අ. පො. ස. (සා. පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

පළමුවර ඃ විභාග අංකය :..........................
වර්ෂය :................. මාධ්‍යය :.................

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

දෙවනවර ඃ විභාග අංකය :..........................
වර්ෂය :................. මාධ්‍යය :.................

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

(*ආ*) අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල (එක් වරකදී) ඃ

විභාග අංකය :..........................
වර්ෂය :.................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

(*ඇ*) ඉහත සඳහන් (අ) සුදුසුකම සපුරා නොමැතිනම් ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් ෑ

ශ්‍රේණිය :————. වර්ෂය :————.
පාසලේ නම හා ලිපිනය :————.

16. සන්ධ්‍යා/අර්ධ කාලීන පාඨමාලා සඳහා පමණක් අදළ වේ.

**(රැකියාගතව සිටිය යුතු බව දක්වෙන පාඨමාලා සඳහා පමණක් මෙම කොටස සේවායෝජක විසින් සම්පූර්ණ කරන්න.)**

16.1 අයදුම්කරුගේ නම :.............................................

16.2 සේවා ස්ථානය හා එහි ලිපිනය :.............................................

16.3 දැනට දරන තනතුර හා ඊට පත්වූ දිනය :.............................................

16.4 සේවක අර්ථසාධක අරමුදල් අංකය ෑ EPF ............ සේවක භාරකාර අරමුදල් අංකය ෑ ETF ............

ඉහත අයදුම්කරු මෙම ආයතනයේ/කාර්යාලයේ සේවය කරන බවට සහතික කරමි.

16.5 සේවා යෝජකයාගේ නම :.............................................

16.6 තනතුර :.............................................

16.7 අත්සන :.............................................

17. ස්වයං රැකියාවක නියුක්ත නම් එහි ස්වභාවය (ග්‍රාම සේවා නිළධාරි විසින් ලිපියක් මගින් තහවුරු කර තිබිය යුතුය.)

:.......................................................................................................................

18. *අයදුම්කරුගේ ප්‍රකාශය ෑ*

ම විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත්, ඉල්ලුම් කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා විසින් සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද, තාක්ෂණ විද්‍යාලවලට/කාර්මික විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම පිළිබඳ පටිපාටියට එකඟවීමට ද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසාන තීරණය පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.............

**තාක්ෂණ විද්‍යාලවල/කාර්මික විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා පිළිබඳ උපලේඛනය - 2022**
**ජාතික වෘත්තීය සුදුසුකම් (3/4) මට්ටම් (NVQ Level - 3/4)**

**කෘෂිකාර්මික වැවිලි හා පශු සම්පත් ක්ෂේත්‍රය - පූර්ණ කාලීන පාඨමාලා**

| අනු. අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුලත්වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍ය/NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 117 | ETB 14 | ආහාර තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>NVQ මට්ටම් 5<br>පූර්ණ කාලීන, දිවා අවුරුදු 02 (පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය/ කර්මාන්තගත පුහුණුව මාස 06 ද ඇතුළත්ය.)<br>(This course includes the subjects of analytical Chemistry, Biotechnology, Nutrition, Quality Control, and Food Safety, Management for Selection, Preservation, Processing, Packaging, Distribution,and use of Safe food)<br>NVQ 5 මට්ටමේ පාඨමාලාව හැදෑරූ අය සඳහා NVQ 6 මට්ටම අධ්‍යාපනයට මහනුවර තාක්ෂණ විද්‍යාලයට ඇතුළත්වීමට අවස්ථාවක් ලබාගත හැක. | 1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම සහ වසරක පළපුරුද්ද. (මෙහිදී අදාළ ක්ෂේත්‍රයේ, වසරකට නොඅඩු NVQ මට්ටම් 4 පාඨමාලාවක් හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ);<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජෛව තාක්ෂණවේදය/ජීවවිද්‍යාව/ කෘෂි විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වී තිබීම.<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ ආහාර තාක්ෂණය (Food Technology) කෘෂි තාක්ෂණය (Agro Technology) යන විෂයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත් වී තිබීම.<br>2. 2022.01.01 දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතුය. | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>කුලියාපිටිය<br>මහනුවර |

*මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය*

*පූර්ණ කාලීන පාඨමාලා* - දේශනවලින් සියල්ල හෝ කොටසක් මාර්ගගත ක්‍රමය මගින් ඉගැන්වීම සිදුකෙරේ.

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා* | *පාඨමාලා මාධ්‍ය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 118 | ETB 15 | ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>NVQ මට්ටම් 5<br>පූර්ණ කාලීන, දිවා, අවුරුදු 02 (පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය/ කර්මාන්තගත පුහුණුව මාස 06ද ඇතුළත්ය.)<br>(This course includes developing design concepts, Technical Drawing and Production Creation, Modern Designing, Quality Checking) | 1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම (මෙහිදී අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු NVQ මට්ටම් 4 පාඨමාලාවක් හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ)<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වී තිබීම.<br>2. 2022.01.01 දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතුය. | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>මරදාන |

*මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය*

*අර්ධ කාලීන පාඨමාලා* - දේශනවලින් සියල්ල හෝ කොටසක් මාර්ගගත ක්‍රමය මගින් ඉගැන්වීම සිදුකෙරේ.

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* |
|---|---|---|---|---|
| 119 | ETB 15.1 | ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>අර්ධ කාලීන, සති අන්ත, අවුරුදු 02 (මාස 06 ක පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br>(This course includes developing design concepts, Technical Drawing and Production Creation, Modern Designing, Quality Checking) | 1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම. (මෙහිදී අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු NVQ මට්ටම් 4 පාඨමාලාවක් හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ)<br><br>හෝ<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වී තිබීම.<br><br>2. 2022.01.01 දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතුය. | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>මරදාන |

මුදල් හා බැංකු කළමනාකරණ ක්ෂේත්‍රය

පූර්ණ කාලීන පාඨමාලා - දේශනවලින් සියල්ල හෝ කොටසක් මාර්ගගත ක්‍රමය මගින් ඉගැන්වීම සිදුකෙරේ.

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* |
|---|---|---|---|---|
| 120 | BSA 01 | ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5 සහ 6 ඒකාබද්ධව පවතී.<br><br>පූර්ණ කාලීන, දිවා, අවුරුදු 2 1/2 (කර්මාන්තගත පුහුණුව මාස 06 ද ඇතුළත්ය.)<br><br>(This course includes Subjects related to Accounting, Costing, Auditing, Taxation Management and other related subjects) | 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය සහ ඉංග්‍රීසි විෂයය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම;<br>සහ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ගණකාධිකරණය, සංයුක්ත ගණිතය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරින් එකක් (01) සහිතව විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම;<br>හෝ<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව (NCAT) හදාරා සමත්ව තිබීම සහ ඊට අදාළ NVQ 4 සහතිකය ලබා තිබීම සහ වසරක පළපුරුද්ද<br><br>2. 2022.01.01 දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතුය. | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>ගාල්ල<br>අම්පාර<br>කුරුණෑගල<br>මරදාන<br>රත්නපුර<br>හෝමාගම<br>කෑගල්ල<br>නුවරඑළිය<br>වරකාපොල<br>මහනුවර<br>අක්කරෙයිපත්තුව<br>සම්මන්තුරේ<br>මාතලේ<br>යාපනය<br>මඩකලපුව<br>වව්නියාව<br>ඇඹිලිපිටිය<br>ත්‍රිකුණාමලය |

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* |
|---|---|---|---|---|
| 121 | ETA 22 | සමුද්‍රීය හා සැපයුම් කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාලීන, දිවා, අවුරුදු 2 (කර්මාන්තගත පුහුණුව මාස 06 ද ඇතුළත්ය.) | 1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම.<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයන් තුනම (03) සමත් වී තිබීම.<br><br>2. 2022.01.01 දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතුය. | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>මරදාන<br>ඇඹිලිපිටිය |

**අධ්‍යාපන ක්ෂේත්‍රය**

පූර්ණ කාලීන පාඨමාලා - දේශනවලින් සියල්ල හෝ කොටසක් මාර්ගගත ක්‍රමය මගින් ඉගැන්වීම සිදුකෙරේ.

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* |
|---|---|---|---|---|
| 122 | ETB 32 | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (National Diploma in Teaching English As a Second Language)<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාලීන දිවා අවුරුදු 1 1/2 (කර්මාන්තගත පුහුණුව මාස 06 ද ඇතුළත්ය.) | වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතිකය (NCPE) ලබා තිබීම<br>හෝ<br>වාණිජ කර්මාන්ත හා වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම (NCE)<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සාමාන්‍ය ඉංග්‍රීසි (General English) විෂයට සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් (03) සමත්වී තිබීම.<br>2022.01.01 දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතුය. | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අම්පාර<br>සම්මන්තුරේ<br>මහනුවර<br>කළුතර<br>කුලියාපිටිය<br>කුරුණෑගල<br>මරදාන<br>වරකාපොල<br>වවුනියාව<br>යාපනය<br>ඇඹිලිපිටිය |

*සටහන :* ඉහත සඳහන් පාඨමාලාවලට අමතරව එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළ කෙටිකාලීන පාඨමාලා තාක්ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාල මගින් ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. එම පාඨමාලා පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබට ආසන්න තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වෙතින් ලබාගත හැක.

02-35/2

## විදේශ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන තරග විභාගය - 2020 (2022)

ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සියරට පේරුවේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් තෝරාගැනීම පිණිස විදේශ අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 මැයි මස කොළඹදී පවත්වනු ලබන තරග විභාගය සඳහා, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ, පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සහ පළාත් පාලන කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2022.02.07 දින පෙ.ව. 9.00ට විවෘත වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන තරග විභාගය 2020 (2022)'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2022.03.03 වැනි දින වේ. මෙම විභාගය 2022 මැයි මස කොළඹදී පවත්වනු ලැබේ.

සටහන : අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

02. යෝග්‍යතාවයඃ මෙහි මින්මතු ''සේවය'' ලෙස හඳුන්වනු ලබන කළමනාකරණ සේවා නිලධාරි සේවයේ/ පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ/ පළාත් පාලන කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අපේක්ෂකයින් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :

(අ) ඉහත සේවයකට අයත් I වැනි පන්තියේ, II වැනි පන්තියේ නිලධාරියකු

හෝ

(ආ) ඉහත සේවයකට අයත්, අවම වශයෙන් වසර 5ක පළපුරුද්දක් ඇති III වැනි පන්තියේ නිලධාරියකු විය යුතුය.

සටහන : ඉහත සේවයන්ට අයත් නොවන වෙනත් කළමනාකරණ සේවා නිලධාරි සේවාවල නිලධාරීන්ට මේ සඳහා ඉල්ලුම් කළ නොහැක.

(ඇ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය, මෙම විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

(ඈ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 57ට අඩු විය යුතුය. (ඒ අනුව 1965.03.03 දිනෙන් පසුව උපත ලත් අය පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.)

(ඉ) අයදුම්පත් ඉදිරිපත් කරන දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ උපයා ගත යුතුව තිබූ සියලුම වාර්ෂික වැටුප් වර්ධක නියමිත දිනට ඔහු/ ඇය විසින් උපයාගෙන තිබිය යුතුය.

(ඊ) අවවාද කිරීම් හැර වෙනත් කවර ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට යටත් නොවී සිටිය යුතුය.

(උ) දැනට ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට අනුයුක්තව සේවය කරන නිලධාරියකු නො විය යුතුය.

(ඌ) කළමනාකරණ සේවා නිලධාරින් සඳහා විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කිරීමට ලැබෙන අවස්ථා සංඛ්‍යාව එකකට පමණක් සීමා කරනු ලැබ ඇත. එබැවින්, මීට පෙර විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කර ඇති කළමනාකරණ සේවා නිලධාරින්ට මෙම *ගැසට් පත්‍රය* යටතේ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්කළ නොහැක.

සටහන :

i. අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ සුදුසුකම් සපුරා ඇති නිලධාරියකු/ නිලධාරිනියක, ඉන් පසුව කළමනාකරණ සේවා නිලධාරි සේවයේ/ පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ/ පළාත් පාලන කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I වැනි පන්තියට වඩා උසස් පන්තියකට/ ශ්‍රේණියකට උසස්වීමක් ලද්දේ නම් හෝ වෙනත් සේවයක තනතුරකට පත්වීමක් ලද්දේ නම් හෝ එම අපේක්ෂකයා/ අපේක්ෂිකාව, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයක කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සියරට පේරුවේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලැබීමට සුදුසුකම් නොලබයි. ඉහත (අ) සහ (ආ) යටතේ සඳහන් සුදුසුකම් කෙරෙහි බලපෑමක් සිදුවන ආකාරයෙන් තම නිල තත්ත්වයේ යම් වෙනසක් ඇතිවුවහොත්, ඒ බව විදේශ අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දීම අදාළ අයදුම්කරුගේ වගකීම වේ.

ii. ගිණුම් හා ආයතන කටයුතු පිළිබඳ පළපුරුද්දක් සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට හැකියාවක් ඇති නිලධාරින්

කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. වෙනත් විදේශීය භාෂාවලින් කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

03. තෝරාගැනීමේ ක්‍රමය: විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් හා විදේශ ලේකම් විසින් පවත්වනු ලබන ප්‍රායෝගික ඇගයීම හා සම්මුඛ පරීක්ෂණය මඟින් තෝරා ගනු ලැබේ.

3.1 විභාග පටිපාටිය

(අ) ලිඛිත පරීක්ෂණය: ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|
| ගිණුම් ක්‍රම | පැය 02 | 100 |
| ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | පැය 02 | 100 |
| ඉංග්‍රීසි භාෂාව | පැය 02 | 100 |

සටහන :

1. මූල්‍ය ක්‍රම: රජයේ ආයතනයක මූල්‍ය කටයුතු හා ගිණුම් පටිපාටි පිළිබඳව අපේක්ෂකයා සතු ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම සඳහා විෂයානුබද්ධ හා විෂය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් කරමින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

2. ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම - රජයේ ආයතනයක ආයතන හා කාර්යාල ක්‍රම පිළිබඳ අපේක්ෂකයා සතු ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම සඳහා විෂයානුබද්ධ හා විෂය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත්කොට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

3. ඉංග්‍රීසි භාෂාව - විදේශ අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වයට අදාළ ලිපි, ලිඛිත පණිවුඩ, රැස්වීම්, වාර්තා කෙටුම්පත් කිරීම, දැන්වීම් ලිවීම යනාදිය සහ ව්‍යාකරණ, අවබෝධය වැනි කරුණුවලට අදාළව අපේක්ෂකයාගේ අවබෝධය සහ ඒ පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සැලසුම් කොට ඇත. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

3.1 (ආ) ප්‍රායෝගික ඇගයීම

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|
| ප්‍රායෝගික ඇගයීම | මිනිත්තු 80 | 60 |

සටහන :

1. *ප්‍රායෝගික ඇගයීම:* මූල්‍ය ගිණුම්, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව, පරිපාලන ක්‍රියා පටිපාටි සහ තොරතුරු තාක්ෂණ කුසලතා පිළිබඳ පරිගණකය පදනම් කර ගනිමින් සිදු කරන ප්‍රායෝගික ඇගයීමකි.

2. ප්‍රශ්න හතරෙන් එක් එක් ප්‍රශ්නයට ලකුණු 15ක් බැගින් හිමි වේ. මුළු ලකුණු ප්‍රමාණය 60 (15X4) ක් වනු ඇත.

3. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස, සියලුම අපේක්ෂකයින් ප්‍රායෝගික ඇගයීම සඳහා අනිවාර්යයෙන් අවම ලකුණු 40% ක් (60X40%=24) ලබා ගත යුතුය.

3.2 සම්මුඛ පරීක්ෂණය:

3.2.1 විදේශ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාදෙන ලකුණු සංඛ්‍යාව 40කි.

3.2.2 අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පටිපාටිය විස්තරාත්මක වශයෙන් පහත දැක්වේ.

| *අංකය* | *ලකුණු ලබා දීමේ නිර්නායක* | *ලකුණු ලැබෙන පිළිවෙළ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 05 |
| | I. පළමු පෙළ සාමාර්ථයක් සහිත උපාධියක් | 05 | |
| | II. දෙවන පෙළ ඉහළ සාමාර්ථ්‍යයක් සහිත උපාධියක් | 04 | |
| | III. දෙවන පෙළ පහළ සාමාර්ථ්‍යයක් සහිත උපාධියක් | 03 | |
| | IV. සාමාන්‍ය සාමාර්ථ්‍යයක් සහිත උපාධියක් | 02 | |
| | සටහන :<br>1. උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කොට තිබිය යුතුය.<br>2. උපාධියේ අධ්‍යයන කාල සීමාව වසර 3කට නොඅඩු විය යුතුය | | |
| 2 | විදේශ අමාත්‍යාංශයීය කටයුතු සඳහා සෘජුව අදාළ වන වෙනත්/වෘත්තීය සුදුසුකම් (ජාත්‍යන්තර සබඳතා, නීතිය, ඉංග්‍රීසි හෝ වෙනත් විදේශීය භාෂා, තොරතුරු තාක්ෂණය, කළමනාකරණය) | | 10 |
| | I. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 10 | |
| | II. ඩිප්ලෝමා | 07 | |
| | III. සහතික පත්‍ර පාඨමාලාව | 05 | |
| | (මෙම සුදුසුකම සඳහා හය මසකට වඩා වැඩි කාල සීමාවක් තිබිය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි ආයතනයකින් හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා සිටිය යුතුය.) | | |

| අංකය | ලකුණු ලබා දීමේ නිර්නායක | ලකුණු ලැබෙන පිළිවෙල | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 3 | සේවා පළපුරුද්ද<br>III ශ්‍රේණියේ පළමු වසර 05 හැරුණු කොට ඉතිරි සේවා කාලය සඳහා වසරකට ලකුණු 0.3 බැගින්<br>II සහ I ශ්‍රේණිවල නිලධාරින්ගේ එම ශ්‍රේණිවලට අදාළ මුළු සේවා කාලය සඳහා වසරකට ලකුණු 0.34 බැගින් (උපරිම ලකුණු 8.5) | 1.5<br><br><br><br>8.5 | 10 |
| 4 | සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය<br><br>I. සන්නිවේදන කුසලතා සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව<br>II. ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනුම<br>III. සංස්කෘතික සංවේදීතාව<br>IV. ධනාත්මක ආකල්ප<br>V. පෞරුෂත්වය හා මනාව සුදානම් වීම | <br><br>05<br><br>03<br><br>03<br>03<br>01 | 15 |
| | මුළු ලකුණු | | 40 |

3.2.3 ලිඛිත පරීක්ෂණයේ සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40%ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් බැගින් ලබා ගන්නා සහ මුළු ලකුණු ප්‍රමාණය 150ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගන්නා අපේක්ෂකයෝ ප්‍රායෝගික ඇගයීම සහ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති. එසේ වුවත්, ඉහත කී ලකුණු ප්‍රමාණයන්ට අනුව සුදුසුකම් ලත් අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී ප්‍රායෝගික ඇගයීමට සහ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ කඩඉම් ලකුණු මට්ටම තීරණය කිරීමේ අයිතිය විදේශ අමාත්‍යාංශයේ ලේකම් සතුවේ. ප්‍රායෝගික ඇගයීම සඳහා වූ ලකුණු ප්‍රමාණයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් (60x40%=24) අපේක්ෂකයින් විසින් ලබා ගැනීම අනිවාර්ය වන අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා අවම ලකුණු ප්‍රමාණයක් නොමැත.

3.2.4 ඉහත 3.2.3 ඡේදයට අනුව ප්‍රායෝගික ඇගයීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් සපුරාලන සියලුම අපේක්ෂකයින්ගේ නම් ලැයිස්තුව අකාරාදී පිළිවෙළට සකසා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විදේශ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබාදෙනු ඇත.

ප්‍රායෝගික පරීක්ෂණයේ සහ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව, අපේක්ෂකයකු විසින් ලිඛිත විභාගයේදී, ප්‍රායෝගික පරීක්ෂණයේදී හා සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා සමුච්චිත ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව සැකසූ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් විදේශ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු ලැබේ.

මීට අමතරව, විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයින් වෙත ප්‍රතිඵල ලේඛනයක් සෘජුව ලබාදෙනු ඇත.

විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවියේ පළ කිරීම මගින් සිදු කෙරෙනු ඇත.

4. අයදුම්කිරීම හා අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :

4.1 මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමුකරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමුකරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්කරු විදේශ දූත මණ්ඩල සේවය සඳහා අයදුම් කිරීමට සුදුසු බවටත්, අයදුම්පතේ සඳහන් තොරතුරු නිවැරදි බවටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කොට පිටසන් කළ යුතු වේ. අදාළ නිලධාරියා/නිලධාරිනිය තෝරාගනු ලැබුවහොත්, නව තනතුරේ රාජකාරි භාර ගැනීම සඳහා ඔහු/ඇය වහාම වර්තමාන තනතුරෙන් මුදා හැරිය හැකි බව ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සඳහන් කොට තිබිය යුතුය.

4.3 අසම්පූර්ණ අයදුම්පත් විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

5. විභාග ගාස්තු:

(අ) විභාග ගාස්තුව රු. 600/කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any bank debit card with Internet Transaction facility)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකිං ක්‍රමය (Bank of Ceylon Online Banking Method)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Bank of Ceylon Slip Payments)

v. තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post Office)

*සටහන* - ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවනු ලබන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

6. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රඃ

6.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිළ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.

6.2 එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කළ ඉහත විස්තර ඇතුළත් ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

6.3 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවාගත යුතුය. තව ද විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

6.4 සෑම අපේක්ෂකයකුම තමාට නියම කොට ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති රීති මාලාවක් ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

6.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

7. විභාගයට පෙනී සිටින මාධ්‍යයඃ

7.1 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් විභාගය පවත්වනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.2 සෑම අයදුම්කරුවකුම ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට හැර අනෙකුත් ප්‍රශ්න පත්‍ර සියල්ලටම සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් එක් භාෂා මාධ්‍යයකින් පමණක් පිළිතුරු සැපයිය යුතු වේ.

8. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් ඃ

8.1 අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේදී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

9. අපේක්ෂකයාගේ අනන්‍යතාව ඃ

9.1 අපේක්ෂකයා පෙනී සිටීමට බලාපොරොත්තුවන සෑම විෂයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන ආකාරයෙන් ඔහුගේ/ ඇයගේ අනන්‍යතාව විභාග ශාලාවේ දී ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනයක් භාරගනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

9.2 එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළත් විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසිඃ

10.1 තෝරා ගනු ලබන නිලධාරින්ට පත්වීමේ ලිපිය නිකුත් කිරීමෙන් පසු පත්වීම භාරගැනීමට නියමිත දින සිට මාස තුනක් ඇතුළත ඔහු/ඇය අනුයුක්ත කරන ලද සේවා ස්ථානයේ රාජකාරි භාර නොගන්නේ නම්, එම පත්වීම අවලංගු වූවා සේ සලකනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

10.2 තෝරා ගනු ලබන නිලධාරින්ට ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කරනු ලැබීමට පෙර ආරම්භයේදී එක් වසරක කාලසීමාවක් කොළඹ, විදේශ අමාත්‍යාංශයේ සේවය කළ යුතුය. විදේශ අමාත්‍යාංශයේ සේවය කරන මෙම ආරම්භක කාලසීමාව තුළදී අංශ ප්‍රධානීන්ගේ එකඟතාව මත ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම් පිළිබඳව ස්වාධීන ආයතනයක් විසින් තක්සේරු කරනු ලබන අතර, ඒවා අසතුටුදායක බව පෙනී ගිය හොත් ඔහුගේ/ඇයගේ තෝරාගැනීම අවලංගු කරනු ලැබීමට යටත් වේ.

10.3 තෝරා ගනු ලබන නිලධාරින් විදේශ දූත මණ්ඩලවලට පත් කිරීම තීරණය කරනු ලබන්නේ ඒ ඒ දූත මණ්ඩලවල අවශ්‍යතා සහ නිලධාරින්ගේ යෝග්‍යතාව හා නිපුණතාව (විදේශ භාෂා නිපුණත්වය ආදිය) පදනම් කරගනිමිනි. නිලධාරින්ගේ පෞද්ගලික අවශ්‍යතාවන් හෝ දුක්ගැනවිලි (දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ආදිය) සලකා බැලීමට විදේශ අමාත්‍යාංශයට වගකීමක් නොමැති අතර, නිලධාරියා/නිලධාරිනියගේ පෞද්ගලික මනාපයන් නොතකා, පත් කරන ලද දූත මණ්ඩලයේ රාජකාරි සඳහා වාර්තා කළ යුතුය. යම් නිලධාරියකු ලබා දී ඇති දූත මණ්ඩල රාජකාරිය භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත්, එම පත්වීම අවලංගු වූවක් ලෙස සලකනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. විභාගයේ සහ සාධාරණ තේරීම් නිර්ණායක පිළිබඳ කොන්දේසිවල වලංගුභාවය සහතික කිරීම සඳහා එවැනි නිලධාරියකු නව විභාගය සඳහා නැවත පෙනී සිටිමින් ඔහු/ඇය පෙර විභාගයේදී හා සම්මුඛ පරීක්ෂණයේදී අනුගමනය කළ ක්‍රියා පටිපාටියට මුහුණ දිය යුතුය.

10.4 ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කරනු ලබන නිලධාරියකු, එකී නිලධාරියා සහ විදේශ ලේකම් විසින් අත්සන් තබන ලද සේවා ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන් මත වසර තුනක කාල පරිච්ඡේදයක් විදේශයකදී සේවය කළ යුතු අතර, ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සුමට ක්‍රියාකාරීත්වය සඳහා විදේශ ලේකම් විසින් වරින් වර නිකුත් කරනු ලබන අමාත්‍යාංශයේ අභ්‍යන්තර චක්‍රලේඛ, අමාත්‍යාංශ උපදෙස් මාලාවේ දක්වා ඇති කොන්දේසි පිළිපැදීමට හා ඒවාට අනුකූල වීම අවශ්‍ය වේ.

10.5 ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කරනු ලබන නිලධාරියකුට ශ්‍රී ලංකාවේදී ඔහු/ඇය විසින් ලබාගන්නා ලද ස්ථිර වැටුප දිගටම ගෙවනු ලබන අතර, ඊට අමතරව විදේශ සේවයේ නිරතව සිටින කාලය තුළදී විදේශ දීමනාවක් ගෙවනු ලැබේ.

10.6 නිලධාරියකු තෝරාගත් පසුව, එකී නිලධාරියාට, ඔහුගේ/ ඇයගේ කලත්‍රයාට සහ උපරිම වශයෙන් නිලධාරියාගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු දරුවන් දෙදෙනකුට පමණක්, ශ්‍රී ලංකාවේ සිට පත්වීම ලබාදෙන රටට යාමට හා ඒමට ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර, විදේශයේ සේවයේ නියැලෙන කාල සීමාව තුළ එරටේ නවාතැන් පහසුකම් සහ වෙනත් පහසුකම් නිලධාරියා සහ රජය අතර අත්සන් තබනු ලබන ගිවිසුමේ සඳහන් ආකාරයට රජය විසින් සලසා දෙනු ලැබේ. ඉහත සඳහන් කර ඇති ප්‍රමාණයට වඩා වෙනත් පවුලේ සාමාජිකයන් සමඟ පැමිණීමට කරන ඉල්ලීමක් සඳහා අමාත්‍යාංශය මඟින් ඉඩ දෙනු නොලැබේ.

10.7 රාජකාරි සංචාරය සඳහා නියමිත කාලසීමාව අවසන් වූ පසු, නිලධාරියා අනිවාර්යයෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණිය යුතුය.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව හා බඳවා ගැනීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතීනම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ,
විදේශ ලේකම්.

විදේශ අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

02 - 46

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## රැකියා සුලභ මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයට පිවිසෙන්න

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO 9001:2015 නවතම තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2022**
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

***පාසැල් හැර ගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ - 4 පාඨමාලාව***
***NVQ 4 Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)***

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබා දේ.

පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000 0

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලය : මාස 4 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000 0

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටි මීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව ගාස්තුව රු. 22,000 0 NVQ - 4 සහතිකපත් පාඨමාලා ගාස්තුව රු. 31,000 0

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලය : මාස 5 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000 0

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨාමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000 0

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල්ලත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000 0

**නවතම 2018 වර්ෂයේ නිෂ්පාදිත වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස් ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණ කරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : වසර 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000 0

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : වසර 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000 0

**ආංකික පෙර මුද්‍රණය - Digital Prepress**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000 0

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000 0

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 07 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000 0

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් මුද්‍රණ ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක

නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙම විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000 0

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුලින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල් වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ටද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750 0

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ ක්‍රියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
0777706995, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊමේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන : 0662222172, 071 0554298.

02-32

---

සංශෝධනයයි

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂෙත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)**

*ගැසට්* පත්‍ර අංක 2193 දරන 2020 සැප්තැම්බර් මස 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2019(2020) නම් වන විභාග නිවේදනයේ 2.1 හි 01., 14.1 හි විෂය අක 01 සහ 15. හි 01. හා 01. හි 1 වන කොටස, අදළ *ගැසට්* නිවේදනයේ 12, යටතේ දක්වා ඇති ආගමන හා විගමන පාලක ජනරාල් වෙත පවතින බලතල ප්‍රකාරව මතු සඳහන් පරිදි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කෙරේ.

2.1

01. අවබෝධය හා සාමාන්‍ය දැනීම

14.1

| විෂය අංකය | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | අවබෝධය හා සාමාන්‍ය දැනීම | 100 | 40 | 2 |

15.

01. අවබෝධය හා සාමාන්‍ය දැනීම කාලය පැය 02 යි. ලකුණු 100 යි.

1 වැනි කොටස - අවබෝධය

| අර්ථ විග්‍රහය සාරාංශ හා ඡේදයක් වටහා ගැනීමේ හැකියාව තීරණය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
|---|

02. එම *ගැසට්* නිවේදනයේ සඳහන් වන අනෙකුත් විධිවිධාන නොවෙනස්ව එලෙසින්ම බලපැවැත්වෙන බව සැලකිය යුතුය.

යූ. වී. සරත් රූපසිරි,
ආගමන හා විගමන පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2022 ජනවාරි මස 24 වැනි දින,
සුහුරුපාය,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

02-15

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **පෙබරවාරි** | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2022.04.01 | සිකුරාදා | 2022.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.08 | සිකුරාදා | 2022.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.12 | අඟහරුවාදා | 2022.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.22 | සිකුරාදා | 2022.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.29 | සිකුරාදා | 2022.04.12 | අඟහරුවාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.